**ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 08 දින සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

-----------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

--------

### 2.1 විසර්ජන ගිණුම

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු පුනරාවර්තන ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 49.82 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 47.94 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු පුනරාවර්තන ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1.88 ක් හෙවත් සියයට 3.77 ක් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

### 2.2 ආදායම් ගිණුම්

---------------

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්**

-------------------------------------

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේත තුනක් සඳහා එකතුව රු.මිලියන 1,220.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 1,359.19 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 111.40 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 20.03.02.10 | 100.00 | 166.48 | 66.48 | 66 |
| 20.03.02.12 | 20.00 | 29.95 | 9.95 | 50 |
| 10.03.02.08 | 1,100.00 | 1,162.76 | 62.76 | 6 |
| | 1,220.00 | 1,359.19 | 139.19 | 11.41 |

**2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 29701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 5.50 | 5.38 | 3.00 | 3.57 | 20.00 | 12.15 |

**2.4 විගණන නිරීක්ෂණය**

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 මාර්ගෝපදේශය ප්‍රකාරව භාණ්ඩ හා වැඩ කොන්ත්‍රාත් වෙනුවෙන් ප්‍රසම්පාදන කාලසටහනක් සකස්කර ගතයුතු වුවද මෙම දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩ වෙනුවෙන් එවැනි කාලසටහනක් විධිමත්ව පවත්වා ගෙන නොතිබුණි.

## 3.2 ආදායම් ගිණුම්

-----------------

දෙපාර්තමේන්තු ප්‍රධානියාට ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේත 03 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරය පැවැරි තිබුණි. එම ආදායම් සංකේතවලට අදාලව සිදුකළ නියැදි විගණනයේ දී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

### (අ) 20.03.02.10 දරන ආදායම් සංකේතය - සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු

--------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට අදාලව රු.මිලියන 100 ක ආදායමක් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 166.48 ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 166 ක් වී තිබුණි. එසේ ඉපයූ මුළු ආදායමින් රු.මිලියන 62.12 ක ප්‍රමාණයක් වාර්ෂික වාර්තා ලියාපදිංචිය සඳහා ලද හිඟ ආදායම වන අතර එය මුළු ආදායමින් සියයට 37 ක් වේ.

(ii) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.මිලියන 286.22 ක ආදායම් හිඟහිට තිබුණු අතර, වර්ෂයට අදාලව හිඟහිටි ආදායම රු.මිලියන 75.41 ක් විය. එම හිඟහිටි ආදායම වර්ෂ 01 සිට වර්ෂ 06 ට වැඩි කාලපරාසයකට අදාළ වූ අතර ඒවා අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(iii) මුදල් රෙගුලාසි 128(2) (ඉ) ප්‍රකාරව රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතුකර ගැනීම සම්බන්ධ විශේෂ විධිවිධාන යෙදිය යුතුවුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iv) 2015 ජූලි 20 දිනැති හා අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04(ආ) ඡේදයට අනුකූලව අයවීමට ඇති හිඟ ආදායම් ප්‍රමාණය සහ හිඟ ආදායම් කිසිවක් වේ නම් එම ප්‍රමාණය ද පැහැදිලිව දැක්වෙන අයුරින් ක්‍රමවත්ව වාර්තා පවත්වා නොතිබුණි.

(v) ඉහත චක්‍රලේඛයේ 4(ආ) ඡේදයට අනුව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම සහ අයවීමට ඇති හිඟ ආදායම් තවතවත් එකතුවීම වැලැක්වීම සඳහා ක්ෂණික පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vi) හිඟ ආදායම් වාර්තාවල වාර්ෂික වාර්තා සඳහා අයවිය යුතු හිඟ ආදායම පමණක් දක්වා තිබුණු අතර ලියාපදිංචි සමිතිවලින් අයවිය යුතු හිඟ වාර්ෂික වාර්තා ආදායම සහ මූල්‍ය වාර්තා ලියාපදිංචි කර නොමැති සමාගම්වලින් අයවිය යුතු හිඟ ආදායම ගණනය කර හිඟ ආදායම් වාර්තාවලට ඇතුළත් කර නොතිබුණි.

### (ආ) 20.03.02.12 දරන ආදායම් සංකේතය - පොදු කොන්ත්‍රාත් පනත යටතේ අය කරනු ලබන ගාස්තු

----------------------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට අදාලව රු.මිලියන 20.00 ක ආදායමක් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට

රු.මිලියන 29.95 ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 50 ක ප්‍රතිශතයකින් වැඩි වී තිබුණි.

(ii) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ (2) (1) වගන්ති ප්‍රකාරව රු. මිලියන 5 ක් ඉක්මවන සියලු පොදු කොන්ත්‍රාත් මෙම පනත යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළයුතු වුවද, අදාළ කොන්ත්‍රාත් සියල්ල ලියාපදිංචි කරවීම සඳහා නිශ්චිතව වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක කර නොමැති වීමෙන් රාජ්‍ය ආදායමට ලබාගත හැකි විශාල ආදායමක් අහිමි වී තිබුණි.

(iii) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 11(3) වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් 14 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ඒ සහතිකය දෙනලද අවස්ථාවේ සිට, එක් අවුරුදු කාලයක් සඳහා බලාත්විතව පැවතිය යුතු අතර, එය නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට එක් අවුරුදු වැඩිදුර කාලයක් සඳහා කලින් කළ අලුත් කරනු ලැබිය හැකිය. එහෙත්,

- වර්ෂයක කාලය ඉකුත් වූ පසු නැවත ලියාපදිංචිය අලුත් කිරීම සඳහා අයදුම් කිරීම සිදු කරන්නේද,

- පොදු කොන්ත්‍රාත්තුවක් නැවත ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කිරීම නිසි පරිදි සිදුවන්නේ ද,

යන්න අධීක්ෂණය කිරීමේ ක්‍රියාමාර්ගයක් මේ දක්වා දෙපාර්තමේන්තුවේ ස්ථාපනය කර නොමැති අතර ඒ නිසා රාජ්‍ය ආදායමට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.

**(ඇ) 10.03.07.08 දරන ආදායම් සංකේතය - සමාගම් ලියාපදිංචි කිරීමේ බදු**

--------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට අදාළව රු.මිලියන 1,100.00 ක ආදායමක් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 1,162.76 ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 106 ක් වී තිබුණි.

(ii) බදු මුදල් අයකර ගැනීම පිළිබඳව විගණනයට ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව 2016 දෙසැම්බර් 31 දිනට බදු ගෙවිය යුතු සමාගම් සංඛ්‍යාව 77,392 ක් වූ අතර බදු ගෙවූ සමාගම් සංඛ්‍යාව 16,826 ක් හෙවත් සියයට 22 ක ප්‍රතිශතයක් විය.

(iii) 2016 වර්ෂය සඳහා ඉදිරිපත් කර සම්මත කරගන්නා ලද අයවැය යෝජනාවක් අනුව මුදල් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි අදාල බදු මුදල් සමාගම් වලින් අයකිරීම සිදුකර ඇත. මෙම බද්ද ක්‍රියාත්මක කිරීමට අදාල ගැසට් නිවේදනයක් නිකුත් කිරීම හෝ මුදල් පනතට අදාල ව්‍යවස්ථාපිත සංශෝධනයක් කර නොතිබුණි. නීතිමය වශයෙන් නිසි අනුමැතියකින් තොරව මෙම බදු මුදල අයකරගෙන ඇති අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගම් අතරින් සමාගම් කිහිපයක් පමණක් මෙම මුදල ගෙවා තිබුණි.

## 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 29701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2004 ඔක්තෝබර් 11 දිනැති හා අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 1.1.6 ඡේදය අනුව කටයුතු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ සිට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තුන් දෙනෙකුගෙන් අයවිය යුතු රු.120,741 ක ණය ශේෂයක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) 2005 අගෝස්තු 01 දින සිට වැඩ තහනමට ලක් වූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු එකතුව රු.17,000 ක්වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) 2004 ඔක්තෝබර් 11 දිනැති හා අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය ප්‍රකාරව නිලධාරියෙක් මාරු වී පැමිණ මාස 02 ගත වීමට පෙර හා මාරු වී ගොස් මාස 03 ක් ගත වීමට පෙර ණය ශේෂ නිරවුල් කළ යුතුය. එසේ වුවත් රු. 444,778 ක ණය ශේෂයන් හිමි ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 05 ක් හා රු.497,297 ක ණය ශේෂයන් හිමි ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 4 දෙනෙකුට අදාල ණය ශේෂ පියවීමේදී මාස 4 සිට මාස 8 දක්වා ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

## 3.4 යහ පාලනය හා ගිණුම්කටයුතුභාවය

### 3.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ), (ඇ), (ඉ) හා 4.2.2 (අ) මාර්ගෝපදේශ ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කරමින් හා ඊළඟ එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව ඇතුළත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළයුතු වන අතර එය මාස 06 කට නොවැඩි කාලයක් තුළ නිතිපතා යාවත්කාලීන කළයුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 3.4.2 අභ්‍යන්තර විගණනය

2009 ජුනි 09 දිනැති හා අංක ඩීඑම්ජ්/2009 (1) කළමනාකරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 133 (2) ප්‍රකාරව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3.5 අනුකූල නොවීම්

### නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 128 (2)(ඉ) | රජයට ලැබියයුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතුකර ගැනීමට සම්බන්ධව විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවද, අප්‍රමාදව හිඟ වාර්ෂික වාර්තා ආදායම් අයකර ගැනීමට ආයතනය විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| **(ආ) 2015 ජූලි 20 දින අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය** | |
| (i) 04 (අ) ඡේදය | අයවීමට ඇති ආදායම් ප්‍රමාණය, එකතු කරන ලද ආදායම් ප්‍රමාණය සහ හිඟ ආදායම් කිසිවක් වේ නම් එම ප්‍රමාණයද පැහැදිලිව දැක්වෙන අයුරින් ක්‍රමවත්ව වාර්තා පවත්වා නොතිබුණි. |
| (ii) 04 (ආ) ඡේදය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම සහ අයවීමට ඇති හිඟ ආදායම් තව තවත් එකතුවීම වැළැක්වීම සඳහා ක්ෂණික පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3.6 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) ලියාපදිංචි සමිති ආදායම

2005 අංක 11 දරන සමිති ආඥා පනත අනුව ලියාපදිංචි සමිති විසින් වාර්ෂික වාර්තා ගොනු කළ යුතු අතර සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික වාර්තා ගොනු කළ යුතු සමිති 12,281 කින් රැස් කරගත හැකි වූ ආදායම රු. 12,281,000 ක් විය. නමුත් වර්ෂය තුළ වාර්ෂික වාර්තා ගොනුකර තිබූ සමිති ප්‍රමාණය 70 ක් පමණක් වූ අතර එමඟින් රැස් කර ගත් ආදායම රු.70,000 ක් හෙවත් අයකර ගත යුතු ආදායමෙන් සියයට 0.57 ක් පමණක් විය. ඒ අනුව හිඟ ආදායම රු. 12,211,000 ක් විය. ක්‍රියාකාරි සමිති හඳුනාගෙන එම හිඟ ආදායම මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ආදායමක් ලෙස දැක්වීමට සහ මුදල් රෙගුලාසි 128 (2) (ඉ) ප්‍රකාර ලියාපදිංචි සමිති වලින් හිඟ වාර්ෂික වාර්තා සඳහා ලැබිය යුතු ආදායම් රැස් කර ගෙන නොතිබුණි.

**(ආ)** සත්‍ය වශයෙන් ක්‍රියාකාරි සමාගම් සංඛ්‍යාව, ක්‍රියාකාරි නොවන සමාගම් සංඛ්‍යාව සහ ක්‍රියාකාරි ලියාපදිංචි සමිති සංඛ්‍යාව සහ ක්‍රියාකාරි නොවන සමිති සංඛ්‍යාව පිළිබඳ නිවැරදි සංඛ්‍යා දත්ත ලබාගැනීම සඳහා විධිමත් පරිගණක දත්ත පද්ධතියක් නොතිබීම නිසා මේ යටතේ රැස්කර ගත හැකි ආදායම් සහ හිඟ ආදායම් නිවැරදිව හඳුනා ගත නොහැකි වී තිබුණි.

## 3.7 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

**(අ)** 2016 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 850 ඉක්මවූ හිඟ ආදායමක් පැවති අතර හිඟ ආදායම් රැස්කර ගැනීම හා ඒ සම්බන්දිත තොරතුරු පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගෙනයාම සඳහා සේවයේ යොදවා ඇත්තේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 03 පන්තියේ I ශ්‍රේණියේ නිලධාරියෙකු පමණක් විය.

**(ආ)** වර්ග අඩි 5000 ක පමණ ඉඩ ප්‍රමාණයකින් යුතු දෙපාර්තමේන්තු ලේඛණාගාරය තුළ අන්තර්ගත ලිපිගොනු සංඛ්‍යාව ආසන්න වශයෙන් 174,787 ක් පමණ වන අතර දෛනිකව භුවමාරුවන ලිපිගොනු ප්‍රමාණය 800 සිට 1000 ක් අතර ප්‍රමාණයක් විය. ඊට අතිරේකව දෛනිකව එකතුවන ලිපිගොනු ප්‍රමාණය දළ වශයෙන් 40 ත් 50 ත් අතර ප්‍රමාණයක් වී තිබුණි. ඒ අනුව ලේඛනාගාරය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ලේඛනාගාරය තුළ ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොවූ අතර ලිපිගොනුවල දූවිලි ඉවත් කිරීම සඳහා පිළිගත් හා විධිමත් වූ ක්‍රමවේදයක් සකස්කර නොතිබූ හෙයින් කාර්ය මණ්ඩලයේ සනීපාරක්ෂාවට දැඩි තර්ජනයක්ව පැවතුණි.

(ii) ලේඛනාගාරය තුළ ස්ථානගත කර පවතින දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ලිපිගොනු සම්බන්ධ ආරක්ෂාව සැලසීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර පෞද්ගලික ආරක්ෂක සේවයේ නිලධාරීන් තිදෙනෙකු එහි රාජකාරී කටයුතු සඳහා අනුයුක්ත කර තිබුණි.

(iii) තවද ආරක්ෂක උපක්‍රමයක් ලෙස යොදා තිබූ ආරක්ෂක කැමරා පද්ධතියද පෞද්ගලික අංශයේ ආරක්ෂක නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ පැවතුණි. ඒ අනුව ලිපිගොනුවල ආරක්ෂාව හා රහස්‍යභාවය පිළිබඳ ගැටලු පැන නැගීමට බහුලවම ඉඩකඩ පවතින බව නිරීක්ෂණය කෙරේ.

**(ඇ)** සමාගම් පනතට අනුකූලව සීමිත සමාගම් ලියාපදිංචි කිරීම සහ එමඟින් නියම කර ඇති විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි සමාගම්වල කටයුතු මෙහෙයවීම සහ ඒ අනුව ක්‍රියාකරන බවට වග බලා ගැනීමත්, එසේ ක්‍රියා නොකරන අවස්ථාවලදී ලියාපදිංචි සමාගම්වල කටයුතු සමාගම් පනතේ නියම කර ඇති විධිවිධානවලට අනුකූලව පවත්වා ගෙන යාමට කටයුතු කරවීම සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ට සමාගම් පනතෙන් පැවරී ඇති ව්‍යවස්ථාපිත කාර්යයක් වුවත්, සමාගම්වල කටයුතු නියාමනය සඳහා වූ දෙපාර්තමේන්තු වැඩපිළිවෙල ප්‍රමාණාත්මක නොවුණි.

**(ඈ)** දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු තුළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සම්බන්ධ සහතිකපත් වල නිවැරදි හා සත්‍ය බව ඒවා නිකුත් කළ අධ්‍යාපනික හා වෘත්තිමය ආයතනයන්ගෙන් සෘජුවම සනාථ කර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 3.8 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු හා (අතිරික්ත) සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 09 | 05 | - |
| (ii) | තෘතීයික මට්ටම | 03 | 02 | 01 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 107 | 75 | 32 | 02 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 25 | 27 | - | - |
| | **එකතුව** | **149** | **113** | **36** | **02** |

(ආ) 2013 වසරේ සිට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර පුරප්පාඩු වී පවතින අතර පූර්ණ කාලීන වැඩබැලීමේ පදනම මත නිලධාරියෙකු පත්කර තිබුණි. සමාගම් රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියේ තනතුරු 02 ක් අනුමතව පවතින අතර එම තනතුරු දෙකෙහි සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරු දෙදෙනෙකු රාජකාරී ඉටු කිරීමේ පදනම මත සේවයේ යොදවා තිබුණි. තවද සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් එක් තනතුරක්ද පුරප්පාඩුව පැවතුණි.

(ඇ) සමාගම් පරීක්ෂක නිලධාරී තනතුරු 10 ක් අනුමතව පවතින අතර එම තනතුරු 10 හා අනුමත කළමනාකරණ සහකාර තනතුරු 54 න් 18 ක පුරප්පාඩු පැවතුණි.

(ඈ) අනුමත නව කාර්යය මණ්ඩලය සංයුතිය තුළ සහකාර/ නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් (පාලන ශ්‍රී.ලං.ප.පා. සේවය) 01 පන්තිය III ශ්‍රේණිය, සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය) 01 පන්තිය III ශ්‍රේණියේ නව තනතුරක්ද අනුමතව පැවති නමුත් එයද මේ දක්වාම පුරප්පාඩු ව පැවතුණි . නීති නිලධාරී තනතුරද පුරප්පාඩුව පවතී. බඳවා ගැනීමේ පරිපාටිය රාජ්‍ය සේවා කොමිසම වෙත සංශෝධනය සඳහා යවා ඇති නමුත් 2017 අගෝස්තු 01 වන විටත් අනුමතව නොතිබුණි.